# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව

---

# 2009 අංක 68 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත

---

**[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 18 වන දින]**

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

2009 නොවැම්බර් මස 20 වන දින **ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ** II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

කොළඹ 5, රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළදී ලබාගත හැකි ය.

**මිළ :** රු. 5.00 යි. තැපැල් ගාස්තුව **:** රු. 5.00 යි.

## 2009 අංක 68 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත

[සහතිකය සටහන් කළේ 2009 නොවැම්බර් මස 18 වන දින]

එල්. ඩී.— ඕ. 53 / 2007.

**1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනත සංශෝධනය කිරීම සඳහා වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවන ලදී :—

**1.** මේ පනත 2009 අංක 68 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල (සංශෝධන) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ.

ලුහුඬු නාමය.

**2.** (මෙහි මින් මතු "ප්‍රධාන ප්‍රඥප්තිය" යනුවෙන් සඳහන් කරනු ලබන) 1982 අංක 28 දරන ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනතේ දීර්ඝ නාමයේ "ග්‍රාමෝදය මණ්ඩල අරමුදල" යන වචන වෙනුවට "ජන දිරිය අරමුදල " යන වචන ආදේශ කිරීමෙන් ඒ දීර්ඝ නාමය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

1982 අංක 28 දරන පනතේ දීර්ඝ නාමය සංශෝධනය කිරීම.

**3.** (1) ප්‍රධාන ප්‍රඥප්තියේ සහ වෙනත් යම් ලිඛිත නීතියක "ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනත" සහ "ග්‍රාමෝදය මණ්ඩල අරමුදල" යන වචන වෙනුවට පිළිවෙලින් "ජන දිරිය අරමුදල පනත" සහ "ජන දිරිය අරමුදල" යන වචන ආදේශ කරනු ලැබිය යුතු ය.

(2) යම් නියෝගයක, රීතියක, නියමයක, දැන්වීමක, නිවේදනයක හෝ වෙනත් ලේඛනයක "ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනත"සහ "ග්‍රාමෝදය මණ්ඩල අරමුදල" යන යෙදුම් ඇති සෑම සඳහනක්ම පිළිවෙලින් "ජන දිරිය අරමුදල පනත" සහ "ජන දිරිය අරමුදල" යන යෙදුම්වලට කරන ලද සඳහනක් ලෙස කියවා තේරුම් ගත යුතු ය.

"ග්‍රාමෝදය මණ්ඩල අරමුදල පනත" සහ "ග්‍රාමෝදය මණ්ඩල අරමුදල" යන යෙදුම් පිළිවෙලින් "ජන දිරිය අරමුදල පනත" සහ "ජන දිරිය අරමුදල" යනුවෙන් හැඳින්විය යුතු බව.

**4.** ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

ප්‍රධාන ප්‍රඥප්තියේ 3 වන වගන්තිය සංශෝධනය කිරීම.

(1) එහි 2 වන උපවගන්තියේ—

(අ) එහි (ආ) ඡේදය ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන කොටස ආදේශ කිරීමෙන් :—

"(ආ) මුදල් විෂයයභාර අමාත්‍යවරයාගෙන් :

එසේ වුව ද, ජනාධිපතිවරයා මුදල් විෂයයභාර අමාත්‍යවරයා ලෙස කටයුතු කරන අවස්ථාවක, මුදල් විෂයයභාර අමාත්‍යවරයා සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් මුදල් විෂයයභාර නියෝජ්‍ය අමාත්‍යවරයා සම්බන්ධයෙන් කරනු ලබන සඳහනක් විය යුතු ය. ;"

(ආ) එහි (ඕ) ඡේදයේ "තැනැත්තන් තිදෙනකුගෙන්" යන වචන වෙනුවට "තැනැත්තන් සිව්දෙනකුගෙන්" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (4) වන උපවගන්තියේ "ඒ සඳහා හේතු නොදක්වා" යන වචන වෙනුවට "ඒ සඳහා හේතු දක්වා" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) එහි (6) වන උපවගන්තියේ "සාමාජිකයන් හතර දෙනකු" යන වචන වෙනුවට "සාමාජිකයන් පස්දෙනකු" යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය සංශෝධනය කිරීම.

**5.** ප්‍රධාන ප්‍රඥප්තියේ 5 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) "වෙනත් යම් නීතියකින්" යන වචනවල සිට "පිහිටුවා ඇති ප්‍රදේශය" යන වචන දක්වා වූ වචන ඉවත් කර, ඒ වෙනුවට "වෙනත් යම් නීතියකින් මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කර ඇති සෑම සමිතියක් හෝ ආයතනයක් වෙත පවරා ඇති බලතල කිසිවකට අමතරව ඒ සෑම සමිතියක් හෝ ආයතනයක් වෙත ඒ සමිතිය හෝ ආයතනය පිහිටුවා ඇති ප්‍රදේශය" යන වචන ආදේශ කිරීමෙන් ;

(2) "1980 අංක 35 දරන" යන වචන සහ ඉලක්කම්වල සිට ඒ වගන්තිය අවසානය දක්වා ඇති වචන ඉවත් කර, ඒ වෙනුවට "මෙහි දෙවන උපලේඛනයේ සඳහන් විෂයවලට අදාළ වැඩ කිසිවක් භාර ගැනීම" යන වචන ආදේශ කිරීමෙන් ; සහ

(3) ඒ වගන්තියේ පැති සටහන ඉවත් කර ඒ වෙනුවට පහත දැක්වෙන පැති සටහන ආදේශ කිරීමෙන් :—

"ලියාපදිංචි සමිතියක හෝ ආයතනයක බලතල"

**6.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියේ "ග්‍රාමෝදය මණ්ඩල වෙත පවරනු ලැබූ" යන වචන වෙනුවට "මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් ලිඛිත නීතියක් යටතේ ලියා පදිංචි කර ඇති සෑම සමිතියක් හෝ ආයතනයක් වෙත පවරනු ලැබූ" යන වචන සහ "යම් ග්‍රාමෝදය මණ්ඩලයක්" යන වචන වෙනුවට "යම් සමිතියක් හෝ ආයතනයක්" යන වචන සහ "ඒ ග්‍රාමෝදය මණ්ඩලයට" යන වචන වෙනුවට "ඒ සමිතියට හෝ ආයතනයට" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තිය සංශෝධනය කිරීම.

**7.** ප්‍රධාන ප්‍රඥප්තියේ 6 වන වගන්තියට ඉක්බිතිවම පහත දැක්වෙන අලුත් වගන්තිය මෙයින් ඇතුළත් කරනු ලබන අතර, එය එම ප්‍රඥප්තියේ 6අ වගන්තිය ලෙස බලාත්මක විය යුතු ය.

ප්‍රධාන ප්‍රඥප්තියේ 6අ අලුත් වගන්තිය ඇතුළත් කිරීම.

"අනුමත සමිති.

6අ (1) මේ පනතේ කාර්යය සඳහා අමාත්‍යවරයා විසින් ලාභ නොලබන සමිතියක් හෝ දේශපාලන නොවන සමිතියක් හෝ ලාභ නොලබන ආයතනයක් වන යම් සමිතියක් හෝ ආයතනයක් අනුමත කරනු ලැබිය හැකි ය.

(2) යම් සමිතියක් අනුමත සමිතියක් වීම සඳහා එම සමිතිය විසින් සපුරාලිය යුතු උපමාන අමාත්‍යවරයා විසින් නියම කරනු ලැබිය හැකි ය.".

**8.** ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තියේ (2) වන උපවගන්තියේ (ඈ) සහ (උ) ඡේදවල ඇති "ග්‍රාමෝදය මණ්ඩල" යන වචන යෙදී ඇති සෑම තැනකම, ඒ වචන වෙනුවට "මේ පනතේ පළමුවන උපලේඛනයේ නිශ්චිතව දැක්වෙන යම් ලිඛිත නීතියක් යටතේ ලියාපදිංචි කර ඇති කවර හෝ ලියාපදිංචි සමිතිය හෝ ආයතනය" යන වචන ආදේශ කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 7 වන වගන්තිය සංශෝධනය කිරීම.

**9.** ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තියේ "1979 අංක 28 දරන දේශීය ආදායම් පනත" යන වචන යොදා ඇති සෑම ස්ථානයකම, ඒ වෙනුවට "1979 අංක 28 දරන දේශීය ආදායම් පනත හෝ 2000 අංක 38 දරන දේශීය ආදායම් පනත හෝ 2006 අංක 10 දරන දේශීය ආදායම් පනත " යන වචන ආදේශ කිරීමෙන් එම වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ 14 වන වගන්තිය සංශෝධනය කිරීම.

ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය සංශෝධනය කිරීම.

**10.** ප්‍රධාන ප්‍රඥප්තියේ 15 වන වගන්තිය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :—

(1) එහි (2) වන සහ (3) වන උපවගන්තිවල “1978 අංක 19 දරන ගමනාගමන මණ්ඩල පනතේ 13 වන වගන්තිය” යන වචන වෙනුවට “1991 අංක 37 දරන ජාතික ගමනාගමන කොමිෂන් සභා පනතේ 14 වන වගන්තිය” යන වචන ආදේශ කිරීමෙන් ;

(2) එහි (5) වන උපවගන්තියේ “පළාත් පාලන සේවය” සහ “පළාත් පාලන සේවා උපදේශක මණ්ඩල” යන වචන වෙනුවට, පිළිවෙලින් “පළාත් රාජ්‍ය සේවය” සහ “පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව” යන වචන ආදේශ කිරීමෙන්.

ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තිය සංශෝධනය කිරීම.

**11.** ප්‍රධාන ප්‍රඥප්තියේ 20 වන වගන්තියේ “සංවර්ධන සභාව” යන යෙදුමේ අර්ථ කථනය ඉවත් කිරීමෙන් ඒ වගන්තිය මෙයින් සංශෝධනය කරනු ලැබේ.

ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය සංශෝධනය කිරීම.

**12.** ප්‍රධාන ප්‍රඥප්තියේ උපලේඛනය පහත දැක්වෙන පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ:—

(1) ඒ උපලේඛනය එහි දෙවන උපලේඛනය ලෙස නැවත අංක යෙදීමෙන් ; සහ

(2) නැවත අංක යොදන ලද දෙවන උපලේඛනයට පෙරාතුවම පහත දැක්වෙන අලුත් උපලේඛනය ඇතුළත් කිරීමෙන් :—

**“පළමුවන උපලේඛනය**

(අ) 1981 අංක 45 දරන පනත මගින් සංශෝධිත 1980 අංක 35 දරන සංවර්ධන සභා පනතේ 17අ වගන්තිය යටතේ පිහිටුවනු ලැබූ යම් ග්‍රාමෝදය මණ්ඩලයක් ;

(ආ) 1995 අංක 30 දරන ශ්‍රී ලංකා සමෘද්ධි අධිකාරිය පනත යටතේ පිහිටුවන ලද සමෘද්ධි බලකාය;

(ඇ) ජාතික රාජ්‍ය සභාවේ 1972 අංක 5 දරන සමූපකාර සමිති පනත යටතේ ලියා පදිංචි කරන ලද සමූපකාර සමිතියක් ;

(ඈ) 2000 අංක 46 දරන ගොවිජන සංවර්ධන පනත යටතේ ගොවිජන සේවා කොමසාරිස්වරයා විසින් ලියාපදිංචි කරන ලද ගොවි සංගමයක් ;

(ඉ) 1979 අංක 69 දරන ජාතික තරුණ සේවා පනත යටතේ පිහිටුවන ලද ජාතික තරුණ සේවා සභාවට අනුබද්ධිත යෞවන සමාජ ; සහ

(ඊ) ඒ යම් ලියා පදිංචි කිරීමක් හෝ අනුමතයක් දීම සඳහා ආණ්ඩුව විසින් අනුමත කරනු ලැබූ යෝජනා ක්‍රමයක් යටතේ යම් අමාත්‍යාංශයක්, ආණ්ඩුවේ යම් දෙපාර්තමේන්තුවක් හෝ ආණ්ඩුවේ වෙනත් නියෝජ්‍යායතනයක් මගින් ලියා පදිංචි කළ හෝ අනුමත කරනු ලැබූ සෑම සංවිධානයක්, සංගමයක් හෝ මණ්ඩලයක්.".

**13.** මේ පනතේ සිංහල සහ දෙමළ භාෂා පාඨ අතර යම් අනනුකූලතාවක් ඇතිවුවහොත්, එවිට, සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු ය.

අනනුකූලතාවක් ඇති වූ විට සිංහල භාෂා පාඨය බලපැවැත්විය යුතු බව.

පාර්ලිමේන්තුවේ සිංහල පනත් කෙටුම්පත්වල සහ පනත්වල වාර්ෂික දායක මිළ (දේශීය) රු. 870 කි. (විදේශීය) රු. 1,160 කි. අංක 163, කිරුළපන මාවත, පොල්හේන්ගොඩ, කොළඹ 05, රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ, ප්‍රකාශන කාර්යාංශයේ අධිකාරි වෙත සෑම වර්ෂයකම දෙසැම්බර් මස 15 වැනි දිනට පෙර දායක මුදල් ගෙවා පසුව එළඹෙන එක් එක් වර්ෂය සඳහා ඒවා ලබාගත හැකිය.